Free download from www.studentlanka.com

OL/2010/21-S-III

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

21 S III

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2010 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2010 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2010

සිංහල භාෂාව හා සාහිත්‍යය III
சிங்களமொழியும் இலக்கியமும் III
Sinhala Language and Literature III

පැය දෙකයි
இரண்டு மணித்தியாலங்கள்
Two hours

## සිංහල භාෂාව හා සාහිත්‍යය III

**වැදගත් :** උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න **පහකට** පමණක් උත්තර සපයන්න.

* **1, 2, 3, 4** ප්‍රශ්නවලටත්, **5, 6, 7** ප්‍රශ්නවලින් **එකකටත්** උත්තර සපයන්න.
මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන **80** කි.

**1.** (i) සිට (x) තෙක් ඇති **සියලු ම** අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර **නොලියන්නේ** නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(i) "එසේ වී නම් තෙපි ම ඔහු මා කරා කැඳවාගෙන එව."
  (අ) මෙම ප්‍රකාශය කිරීමට හේතු වූ කරුණ කුමක් ද?
  (ආ) මෙහි ඔහු යනුවෙන් හඳුන්වා ඇති අයගේ නම ලියන්න.

(ii) "බලන්න මේ මූණ දිහා හරියට පණුපිටින් වාගෙ"
  (අ) මෙම ප්‍රකාශය හා සබැඳි අවස්ථාව කුමක් ද?
  (ආ) මෙම කොටස උපුටාගත් කෙටි කතාවේ කතුවරයා කවරෙක් ද?

(iii) "**දියෙකින් නැගුණු ගින්නක් මෙන්** වියැ     මෙදිනේ
ඉතිකින් කෙසේ වැවෙම් දෝ හිමි     සඳිනේ"
  (අ) මෙම කවියේ මුල් පද **දෙක සම්පූර්ණ** කරන්න.
  (ආ) තද කළු අකුරින් මුද්‍රිත කොටසින් ඇඟවෙන සිදුවීම කුමක් ද?

(iv) "මොක ද මේ පැත්තෙ හුඟක් කාලෙකින් නාවේ?"
  (අ) මෙය කාගේ ප්‍රකාශයක් ද?     (ආ) එය ශ්‍රවණය කළේ කවරකු ද?

(v) "ගැටවටු ගත්වා සිවුරු වැලඳගෙන පාත්‍රය පටවා ගෙන **දකුණු මුහුද ගමන් ගත් නැවක් මෙන්** අහසින් අවුත් බිමට බැස ලා"
  (අ) මෙම පාඨය උපුටා ගත් මුල් කෘතිය නම් කරන්න.
  (ආ) තද කළු අකුරු සහිත කොටසින් උපමාවට ලක් කර ඇත්තේ කවුරුන් ද?

(vi) "ඇත්තට ම මේ නම් තිත්ත වස කෝප්පයක් නොවේ ද?"
  (අ) මෙසේ සිතුවේ කවරකු ද?     (ආ) තිත්ත වස කෝප්පයක් ලෙස හඳුන්වන ලද්දේ කුමක් ද?

(vii) (අ) සිවු පද ආරෙන් රචිතව, දනට දක්නට ඇති මුල් ම ජාතක කතා කාව්‍යය කුමක් ද?
  (ආ) එම කාව්‍ය ග්‍රන්ථයේ රචකයා කවරකු ද?

(viii) "**සුදු** සක ලෙසට ඇත් පැටියෙක් විත්     යහනේ
**සුදු** යම් දෙයක් සිදුවෙයි මම දුටු     සිනේ"
එක් එක් කවි පදයේ තද කළු අකුරෙන් මුද්‍රිත වචනවල අදහස් වෙන් වෙන්ව ලියන්න.
  (අ) සුදු     (ආ) සුදු

(ix) (අ) සද්ධර්මරත්නාවලිය ලියන ලද්දේ කුමන කෘතියක් ඇසුරු කර ගෙන ද?
  (ආ) කාබුලිවාලා සහ වෙනත් කතා නමැති පරිවර්තන කෘතිය ලියූ කතුවරයා කවරකු ද?

(x) පහත සඳහන් ග්‍රන්ථ ලියැවුණු සාහිත්‍ය යුග නම් කරන්න.
  (අ) පන්සිය පනස් ජාතක කතා පොත     (ආ) පූජාවලිය

(ලකුණු 02 × 10 = 20 යි)

[ දෙවැනි පිටුව බලන්න.

Free download from www.studentlanka.com



**2.** පහත දක්වෙන ගද්‍ය හා පද්‍ය පාඨවල **තද කළු අකුරින්** මුද්‍රිත කොටස්වල අර්ථය වෙන් වෙන් ව ලියන්න. ඉන් පසු මුළු කොටසේ ම අර්ථය ලිහිල් බසින් ලියන්න.

(i) "එක් වේලෙක අනුභව කළ දෙය එක් වේලෙක නගා පියා ජීවිතය රක්ෂා කෙරෙති. එකල සිටාණෝ **ශුෂ්ක කාෂ්ඨයක්** සේ වියළී දවසින් දවස **පඬුවන් ව** ගියහ."

(ii) "නිධාන නම් රජ දරුවන් **සන්තක** බව නොදනු ද? කිමෙක් ද? තෙපි හලාහල විෂටත් වඩා උග්‍ර වූ **වර්ගවිනාශයට** කාරණා වූ නිධාන තබාගෙන ප්‍රයෝජන විඳු දැයි කියා භය ගන්වා බණන්නී."

(iii) "අතක් බෝසතුන් ලෙයි තබමින් විමසා
මදක් සැලි සැලී පණනල තිබෙනා නිසා
**පසක් තෙදැති** දෙවියන් යදිමින් නොලසා
**නැතක් කන්නලවු** බස් තෙපලයි මෙලෙසා"

(iv) "සතුටු ව උදන් ගී කිය කියා තමා හා **ඒකාත්මක** වූ **මිත්‍ර පුත්‍රකලත්‍රාදීන්** හා පරිවාර ජනයන් පිරිවරා නිත්‍යසන්තෝෂයෙන් පින පිනා නොයෙක් කෙළි නළුයෙහි නියුක්ත ව සැපසේ වසන්නාහු ම ය." *(ලකුණු 05 × 04 - 20 යි)*

- **3, 4** යන ප්‍රශ්න සඳහා වන උත්තරයක වචන **125** ක් පමණ තිබීම සෑහේ.

**3.** උත්තරෝලිය වස්තුව රසවත් කතා පුවතක් ලෙස අගය කළ හැක්කේ,

(i) උචිත රචනෝපක්‍රම යොදා ගැනීම

(ii) විශ්වසනීයත්වය ගොඩනැගෙන ලෙස ඉදිරිපත් කිරීම

යන කරුණු නිසා ය. එක් කරුණකට උදාහරණ **දෙක** බැගින් දක්වමින් පැහැදිලි කරන්න.

**නැතහොත්**

කාව්‍යශේඛර කතුවරයා,

(i) බමුණු සමාජය උපහාසයට ලක් කිරීම

(ii) උචිත අවස්ථා පමණක් තෝරා ගැනීම

ඉතා මැනවින් කර ඇති බව පෙනේ. නියමිත කොටසින් උදාහරණ **දෙක** බැගින් දක්වමින් පැහැදිලි කරන්න.
*(ලකුණු 15 යි)*

**4.** "අපටත් දවසක ඉර පායාදෝ" කෙටි කතාව තුළින් කතුවරයා උත්සාහ ගෙන ඇත්තේ,

(i) දිළිඳු සමාජය පත් ව ඇති පීඩාකාරී වාතාවරණය

(ii) ධනවත් සමාජය අයුතු ලෙස වරප්‍රසාද ලබා ගැනීමට ගන්නා උත්සාහය

යන කරුණු අතරට මැදි වන දරුවකුගේ සංවේදී හැඟීම් විස්තර කිරීමට ය. එක් කරුණකට උදාහරණ **දෙක** බැගින් දක්වමින් විස්තර කරන්න.

**නැතහොත්**

මඟුල් ප්‍රස්තාව නාට්‍යයේ සාර්ථකත්වයට හේතු වී ඇත්තේ,

(i) කුතුහලය ජනනය වන අවස්ථා ඉදිරිපත් කිරීම

(ii) හාස්‍යය මතු කිරීමට ගන්නා උත්සාහය

යන කරුණු ය. නාට්‍යයේ පෙළ ඇසුරෙන් එක් කරුණකට උදාහරණ **දෙක** බැගින් දක්වමින් විස්තර කරන්න. *(ලකුණු 15 යි)*

- **5, 6, 7** ප්‍රශ්නවලින් **එකකට** පමණක් උත්තර ලියන්න. උත්තරයක වචන **100** ක් පමණ තිබීම සෑහේ.

**5.** 'වැස්ස නිසා පරිසරයේ ඇති වන සුවිශේෂතා ප්‍රතිනිර්මාණය කිරීමෙහි ලා කවියා දක්වන්නේ අපූර්ව කුසලතාවකි.' වැස්ස කවිපෙළ ඇසුරෙන් උදාහරණ **තුනක්** දක්වමින් විස්තර කරන්න. *(ලකුණු 10 යි)*

**6.** ශ්‍රද්ධා භක්තියෙන් දෙන ඉතා සුළු දානයක් වුවත් මහත්ඵල මහානිසංස ලබාදෙන අයුරු මනාව විදහා දක්වමින් රසික සිත් ඇදබැඳ තබා ගැනීමට කතුවරයා සමත් වී ඇති ආකාරය සද්ධර්මාලංකාරයේ නියමිත කොටසින් උදාහරණ **තුනක්** දක්වමින් පැහැදිලි කරන්න. *(ලකුණු 10 යි)*

**7.** "ස්වාර්ථය පමණක් ප්‍රාර්ථනය කරන්නා මහත් වූ ව්‍යසනයන්ට මං පෙත් විවර කර දෙන අයුරු සිත් කාවදින ආකාරයෙන් කියාපෑමට ගත් සාර්ථක උත්සාහයක් ලෙස වේදබ්භ ජාතකය අගය කළ හැකි ය." උදාහරණ **තුනක්** දක්වමින් පැහැදිලි කරන්න. *(ලකුණු 10 යි)*

***